සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4thfloor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/3/ACC/14/ Dele 2016
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2016.11.01

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරින්
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
සියළුම මහ සංගම් කළමනාකරුවන්
මූලස්ථාන කළමනාකරුවන් සහ සියළුම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කළමනාකරුවන්

## ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම - 2016

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම 2016 සම්බන්ධව නිකුත් කරන ලද මාගේ අංක 01/2016 හා 2016.02.18 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. එම චක්‍ර ලේඛයේ 12 වන ඡේදය යටතේ දක්වා ඇති වියදම් දැරීම සඳහා අධිකාරි බලය හා සීමාවන් යටතේ ලබාදී ඇති මූල්‍ය සීමාව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

| මිලදී ගැනීමේ ක්‍රමය | බලතල පවරා දී ඇති සීමාවන් | සිදුකරනු ලබන සංශෝධනය |
|---|---|---|
| මිල සැඳහුම් ක්‍රමය | **ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රසම්පාදන කමිටුව :** වැඩ - මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් රු. 1,000,000.00 දක්වා | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව නිකුත් කළ ප්‍රසම්පාදන කාර්ය සඳහා වූ අතිරේක අංක 28 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන යොමුව 2.14.1 මගින් ලබාදී ඇති බලය යටතේ ඉදිකිරීම් /වැඩ සඳහා රු. 2,000,000.00 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් රු. 1,000,000.00 දක්වා | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා සඳහා ලබාදී ඇති රු. 1,000,000.00 සීමාව නොවෙනස්ව පවතී |

03. මෙම සීමා සංශෝධනය දිවිනැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය ආදර්ශ ගම්මාන හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය මට්ටමෙන් බලපවත්වන ගැටළු පිළිබඳව අනාවරණය වූ කරුණු පිළිබඳ සලකා බලා සිදුකරන ලද අතර, නව සංශෝධනය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත උක්ත වැඩසටහන කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත.

04. ගිණුම් හා මූල්‍ය බලතල පැවරීම - 2016 චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් උපදෙස් කිසිදු සංශෝධනයක් නොමැතිව ඒ ආකාරයෙන්ම බලපවත්වන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**නීල් හපුහින්න**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම් - මුදල් අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 02. | ලේකම් - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 03. | ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 04. | ලේකම් - සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 05. | විගණකාධිපති | - | කා.දැ.පි. |
| 06. | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | - | කා.දැ.පි. |